## 413 දෙව්දූ වචනයට

දෙව්දූ වචනයට අවනත වී
ළඳුන් අතර මිණි පහනක් වී
ජේසුගෙ මව වූ අම්මේ
අපිත් ඔබේ දරුවෝ

අම්මේ ආදර අම්මේ
අපිත් ඔබේ දරුවෝ

ආදරයෙන් රත් කිරි පොවලා
මවකගෙ යුතුකම් ඉටු කරලා
ජේසු හදා ගත් අම්මේ
අපිත් ඔබේ දරුවෝ

සුව සැප නොතකා වෙහෙස දරා
නිදි නොලබා සිය දෙනෙත පුරා
ජේසුව ඇඩ් කළ අම්මේ
අපිත් ඔබේ දරුවෝ

කුරුස ගසේදී ඔබ අමතා
ජේසු තුමා කී වචන අසා
අපව බාර ගත් අම්මේ
අපිත් ඔබේ දරුවෝ